// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2258/48 - 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා - 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, සයිස්ටන් ග්‍රාමීය ජල යෝජනා ක්‍රමයේ, සේවා ජලාශය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,<br>
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/331.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,<br>
ජල සම්පාදන අමාත්‍යාංශය,<br>
"ලක්දිය මැදුර",<br>
අංක 35,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
පැලවත්ත,<br>
බත්තරමුල්ල.

1A - G 35589 — 43 (2021/12)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 585, බලකඩුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහ මුදුන ගමේ පිහිටි, "ගලබොඩහේන" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 5.9ක් පමණ වන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | ජී. ජී. අචිනි කෞෂල්‍යා සේනාරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | ජී. ජී. අචිනි කෞෂල්‍යා සේනාරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස හා ජී. ජී. අමරකෝන් හිමිකම් කියන ඉඩම ; |
| දකුණට | : | ජී. ජී. අමරකෝන් හිමිකම් කියන ඉඩම හා අලවතුගොඩ - මල්ගමන්දෙනිය මාර්ගයේ සිට නිවාස දක්වා වැටී ඇති මාර්ගය ; |
| බටහිරට | : | ජී. ජී. අචිනි කෞෂල්‍යා සේනාරත්න හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස හා අලවතුගොඩ - මල්ගමන්දෙනිය මාර්ගයේ සිට නිවාස දක්වා වැටී ඇති මාර්ගය. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. ජී. ජී. අචිනි කෞෂල්‍යා සේනාරත්න මෙනෙවිය,
අංක 598, මහ මුදුන,
අලවතුගොඩ.

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ, කුළුගම්මන පොම්පාගාරය ඉදිකිරීම සඳහා අතිරේක ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/332.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 447, කුළුගම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කුළුගම්මන ගමේ පිහිටි, "පන්සල් වත්ත නොහොත් පන්සල් අරඹ" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 03ක් පමණ වන ඉඩම් කොටස.

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මහනුවර කුරුණෑගල ප්‍රධාන මාර්ගයේ 4 කණුවේ සිට කුළුගම්මන දක්වා වැටී ඇති මාර්ගය හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| නැගෙනහිරට | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කුළුගම්මන පොම්පාගාරය ඉදි කිරීම සඳහා රජයට අත්කර ගත් ඉඩම ; |

දකුණට : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කුළුගම්මන පොම්පාගාරය ඉදි කිරීම සඳහා රජයට අත්කර ගත් ඉඩම හා මෙම ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 01. විහාරාධිපතීන් වහන්සේ,
කුළුගම්මන රජ මහා විහාරය,
කුළුගම්මන.

02. මහා භාරකාරතුමා,
මහා භාරකාර දෙපාර්තමේන්තුව,
කොළඹ.

EOG 12 - 0176

---

## 1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, නෙල්ලිගල බූස්ටර් පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/KY/329.

2021 දෙසැම්බර් මස 13 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර",
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 652, දෙගල්දොරුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දෙගල්දොරුව ගමේ පිහිටි, "දෙගල්දොරුව රජමහා විහාර ඉඩම" නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 5ක් පමණ වන ඉඩම් කොටස.

*මායිම් :*

උතුරට : යක්කහපිටිය සිට බෝධිගල දක්වා දිවෙන මාර්ගය ;
නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 01. භාරකාර තැන (දෙගල්දෝරුව රජමහා විහාරය),
දෙගල්දෝරුව රජමහා විහාරය,
දෙගල්දෝරුව,
යක්ගහපිටිය.

EOG 12 - 0177

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.